# ඓතිහාසික සටනක ජය බිම වූ ගන්නෝරුව රජමහා විහාරය

**කේ. බණ්ඩාරනායක**





**පැරැණි ධර්ම ශාලාව සහ නව ධර්ම ශාලාව**



**වහළක් සහිත ස්ථූපයව**

උඩරට රාජධානිය ආක්‍රමණය කර ආධිපත්‍ය තහවුරු කරගැනීමට කුරුමානම් ඇල්ලූ විදේශ හමුදා ඒ සැම විටම පසු බැස්සේ ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළ සිංහල රණ විරුවන් නිසා බවට ඉතිහාසය සාක්ෂි දරයි. මෙවැනි විරෝදාර සටන් ඉතිහාසයේ ගන්නෝරුව සටන සිංහල ජාතිය පවතිනතාක් මේ බිමේ අනුස්මරණීයව පවතිනු ඇත. ගන්නෝරුව සටනේ නිජ බිම වූ ගන්නෝරුව රජමහාවිහාර භූමිය රණ බිම ලෙස සඳහන් වූයේ ද ගන්නෝරු සටනේ අපේ සිංහල රණවිරුවන් දැක්වූ විරෝදාර ජයග්‍රහණය නිසාමය. මේ හැම වීර ක්‍රියාවකට නිජභූමිය වූ ගන්නෝරුව රජමහා විහාර භූමියට කොළඹ සිට මහනුවර මාර්ගයේ ගමන් කරන විට හමුවන පේරාදෙණිය මංසන්ධියේ සිට ගන්නෝරුව මාර්ගයේ කිලෝමීටර් තුනක් යනවිට ද, මහනුවර පේරාදෙණිය මාර්ගයේ කිලෝමීටර් තුනක් ගමන් කර ගැටඹේ අලුත්පාලමෙන් පේරාදෙණිය මාර්ගයේ කිලෝමීටර් දෙකක් පමණ ගිය විට ද යා හැකිය.

පරංගි ගන්නොරුව ආක්‍රමණ වකවානුවේදී ගම්පොල රජ පැමිණියේ 6 වෙනි බුවනෙකබාහු රජ තුමාය. රජතුමාට ඔටුනු පැළඳවීමට තිලංග බමුණා ඇතුලු බමුණන් හයදෙනෙක් මහ වැලිගං ඉවුරේ ඔරුව තබා මෙහි පැමිණ පැරැණි බෝධියට ආගමික වතාවත් පවත්වා ඇත.



**ඝණ්ඨාර ස්ථම්භය**

නැවත ගමන් ආරම්භකර ඔරුව වෙත පැමිණි පිරිස ඔරුව ගල් පව්වක සැගවී ඇති අයුරු දැක ගං ඔරුව යනු වෙන් ප්‍රකාශ කර ඇති බවත් පසුව එම කතාව ගන්නොරුව ලෙස භාවිතයට පත්ව ඇති බවත් ජනප්‍රවාදයේ සඳහන් බව ගන්නෝරුව වත්මන් විහාරාධිපති මාදන්වල සරණපාල නාහිමියෝ සඳහන් කරති. පරංගි හමුදාව පරදා උඩරට ජයගත් රණ බිම වූ මෙහි පැරැණි සිද්ධස්ථානය ගන්නෝරුව රක්ෂිකයේ ඉදි කැරිණි. වත්මන් විහාරයේ දියුණුව විහාරාධිපති අධිකරණ සංඝනායක මාදන්වල සරණපාල නාහිමි යුගයේ ඇති වූවකි.



**පැරැණි විහාරයේ දොරටුව**

පැරැණි විහාරය, අලුත් විහාරය, චෛත්‍ය සහිත විහාර මන්දරය බණ මඩුව සහිත ධර්මශාලාව චෛත්‍යමලුව සහ ඝන්ඨාර ස්ථම්භය සංඝාවාසය සහිත නවීන දනශාලාව ඇතුලත් මෙම විහාරස්ථානය යටිනුවර ප්‍රදේශයේ පැරැණිම වෙහෙර විහාර වලින් එකකි.

ලෙන් සහිත පැරැණි රජ මහා විහාරය ගන්නෝරුව රක්ෂිතයේ පවත්වාගෙන යන අතර රජමහා විහාරය මගින් ස්ථාන දෙකේම ආගමික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.